# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
### 2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

**බෞද්ධ සංස්කෘතිය BUCU E - 1015**

**භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම**

ප්‍රශ්ණ පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 03 යි

01. භාරතීය ප්‍රාග් වෛදික ආගමික චින්තාව හඳුනාගැනීමෙහි ලා පුරාවිද්‍යාත්මක සාධක මගින් ලැබෙන අනුබලය පිරික්සන්න.

02. ඉන්දු ආර්යයන්ගේ ආගමික චින්තනය හා තදනුබද්ධ සංස්කෘතිය ස්වභාවික වස්තු වන්දනය තුලින් ගොඩනැගුණු අයුරු පෙන්වා දෙන්න.

03. යාගය ප්‍රබල ආගමික සංස්කාරක විධියක් ලෙස බ්‍රාහ්මණ සම්ප්‍රදාය තුළ ගොඩනැගී තිබූ අයුරු පෙන්වා දී ඒ පිළිබඳව බුදුසමය දැක්වූ ආකල්පය ගෙනහැර දක්වන්න.

04. මානව වර්ගීකරණය සම්බන්ධ බ්‍රාහ්මණ හා බෞද්ධ ආකල්පයන්හි පදනම හා පසුබිම විමසුමට ලක්කරන්න.

05. ශ්‍රමණ සම්ප්‍රදාය ප්‍රභවය වීමෙහි ලා පදනම් වූ හේතු යුක්ති පරීක්ෂා කොට ඊට ආවේණික වූ අනන්‍යතා ලක්ෂණ පෙන්වා දෙන්න.

06. අත්තකිලමථානුයෝගී ප්‍රතිපදාවේ අරමුණු, පරමාර්ථ හා ක්‍රියාකාරිත්වය පැහැදිලි කොට බුදුසමය මේ සම්බන්ධයෙන් දක්වන ආකල්පය මූලාශ්‍රයානුසාරයෙන් ප්‍රකට කරන්න.

07. මක්ඛලීගෝසාලතුමාගේ ඉගැන්වීම් පැහැදිලි කොට එමගින් පුද්ගලයාගේ ස්වාමිත්වය, නිදහස හා වගකීම නිශේධනය වන අයුරු පෙන්වා දෙන්න.

08. නිදහස් නිවහල් චින්තනයක් උදෙසා බුදුසමයෙන් ලැබෙන පිටිවහල මූලාශ්‍රයානුසාරයෙන් විභාග කරන්න.

09. ත්‍රිවිධ ශික්ෂාව අනුපූර්ව ශික්ෂණ ප්‍රතිපදාවක් ලෙස පුද්ගලාභිවෘද්ධිය පිණිස ඉවහල්වන අයුරු පරීක්ෂා කරන්න.

10. බ්‍රාහ්මණ චින්තනයට සාපේක්ෂව කාන්තාව සම්බන්ධයෙන් බුදුසමය දැරූ මතය ප්‍රගතිශීලී ආකල්පයක් බව මූලාශ්‍රයානුසාරයෙන් ප්‍රකට කරන්න.